# පොළොන්නරු යුගයේ පැවති සමාජ හා ආර්ථික පසුබිම

## The social and the economy background of the Polonnaru era

මැදවච්චියේ සංඝානන්ද හිමි

**Abstract**

Economic and social condition are very important to develop country. According to history of our country, it can be seen that there was a good economy and social condition especially during the Polonnaru era. Some kings of Polonnaru era always tried to continue a good economy and social condition well, but some kings wanted only royalty. This research was conducted based on the problem what was the economic and social background of the Polonnaru era and what did the kings of the Polonnaru era take the actions to develop the economy and social condition. It is important to be inspired by activities of past king to develop modern Sri Lanka. The primary purpose of this research is to examine what did the kings 0f Polonnaru era do to develop the economy and society. For this purpose, data obtained from primary and secondary sources are analyzed under qualitative analysis methods. Firstly, Polonnaruva kingdom was built by the first king Vijayabahu. When he becomes the king of Sri Lanka, Anuradhapura city and lakes had been destroyed by Cholas. However, the first king Vijayabahu attended to the agriculture, irrigation and international trade to develop the economy. Not only the first king Vijayabahu but also the first king Parakramabahu attended to develop

the economy about this. Social background of the Polonnaru era was based on the caste. Can be seen that there was a good economy and social condition, an agriculture, an irrigation, an international trade, an advanced technology.

**Keywords:** the Polonnaru era, the first king Vijayabahu, the first king Parakramabahu, the economy, the society

**හැඳින්වීම**

අනුරාධපුර රාජධානියේ අවසාන භාගයේ දී රාජ්‍ය පාලකයා වූ පස්වෙනි මහින්ද (ක්‍රි. ව. 982-1029) රජුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතු කොට ගෙන අනුරාධපුර නගරය චෝළ ආක්‍රමණයකට ගොදුරු විය. මේ සමයේ දී අනුරාධපුර චෝළ බලයට එරෙහිව සේනා සංවිධානය කරමින් කිත්ති නම් කුමාරයා ද රුහුණු ප්‍රදේශයේ නායකත්වය ලබා සිටියහ. ඉක්බිතිව පළමුවෙනි විජයබාහු නමින් ප්‍රසිද්ධ වූ අතර, චෝළයන්ගෙන් පැරණි ලංකාව බේරාගෙන දේශපාලන බලය එක්සත් කොට පොළොන්නරුව අගනගරය ලෙස තෝරා ගෙන රාජ්‍ය කළේය. එතැන් සිට පොළොන්නරුව ශ්‍රී ලාංකික ඉතිහාසයේ දෙවන අගනගරය බවට පත් විය.

පොළොන්නරුව ප්‍රධාන අගනගරය ලෙස තෝරා ගැනීමට ප්‍රබල දේශපාලන උපාය වූයේ එහි භෞතික පිහිටීමයි. විශේෂයෙන් රෝහණ හා මලය ප්‍රදේශවලින් එල්ල විය හැකි අභ්‍යන්තර කැරලි කෝලාහල මෙන් ම බාහිර රාජ්‍යවලින් එල්ල විය හැකි ආක්‍රමණ ආදී විවිධ දේශපාලන බලවේග ආදියට මුහුණ දීමට හැකි පසුබිමක පැවතිණි. තව ද අනුරාධපුර නගරය චෝළයන් අතින් විනාශ වූ නිසා පොළොන්නරුව අගනුවර කොට රාජ්‍ය පාලන කටයුතු මෙහෙයවීමට විජයබාහු රජතුමාගේ (ක්‍රි. ව. 1055-1110) තිබූ පෞද්ගලික කැමැත්ත ඊට හේතු වූ බව සිතිය හැකිය. එමෙන් ම සාරවත් භූමි ප්‍රදේශයක් පැවතීම ද තවත් සාධකයක් වූවා නිසැක ය.

පළමුවන විජයබාහු රජතුමාගෙන් පසුව ඔහුගේ සොහොයුරු පළමුවන ජයබාහු (ක්‍රි. ව. 1110-1111) කෙටි කාලයක් රාජ්‍ය කටයුතු මෙහෙය වීය. ඉන්පසු පළමුවන වික්‍රමබාහු (ක්‍රි. ව. 1111-1132), දෙවන ගජබාහු (ක්‍රි. ව. 1132-1153) ආදි රජුන් පොළොන්නරුවේ රාජ්‍ය පාලන කටයුතු සිදු කළහ.

පැරණි ලංකාවේ සමාජ, ආර්ථික හා දේශපාලන ව්‍යූහයේ වඩාත් කැපී පෙනෙන ක්‍රියාදාමය මතුවන්නේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි. ව. 1153-1186) රාජ්‍ය සමයේ දී ය. පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය පාලනය අතිශයින් වැදගත් වන්නේ විවිධ හේතු මත බෙදීමකට ලක් වී තිබූ රට එක්සත් කොට මධ්‍යගත පාලනයක් යටතට යොමු කිරීමට කටයුතු කළ නිසාය. එය වූ කලී සමාජ, ආර්ථික හා ශාසනික වශයෙන් අභිවෘද්ධියක් ඇති කිරීමට හේතු විය.

ඒ අනුව පොළොන්නරුව යුගයේ පැවති සමාජ පසුබිම පිළිබඳවත්, පළමුවෙනි විජයබාහු රජතුමා හා පරාක්‍රමබාහු රජතුමා රටේ ආර්ථිකය නැංවීම උදෙසා කළ මෙහෙය පිළිබඳවත් විමර්ශනාත්මකව කරුණු අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරමි.

**සාහිත්‍ය විමර්ශන**

ජයසිංහ බාලසූරිය මහතා විසින් (2007) රචනා කරන ලද මහවැලිය හා ඓතිහාසික පොළොන්නරුව යන කෘතියෙහි පොළොන්නරු රාජධානිය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රාශියක් අන්තර්ගත වී ඇත. එම කෘතියෙහි වැඩි අවධානයක් යොමු කර ඇත්තේ පොළොන්නරුවේ වාරි මාර්ග ක්ෂේත්‍රය වෙනුවෙනි. නමුත් මෙහි සමාජ හා ආර්ථික තත්වය පිළිබඳව තොරතුරු ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. පොළොන්නරුවේ ඇති වැව් රාශියක් පිළිබඳව තොරතුරු එහි ගැබ් වී ඇත. මෙම පර්යේෂණය සිදුවන්නේ පොළොන්නරු යුගයේ පැවති සමාජ හා ආර්ථික පසුබිම පිළිබඳව නිසාවෙන් මෙම කෘතිය ද මෙම පර්යේෂණය සඳහා ද්විතීක මූලාශ්‍රයක් වශයෙන් භාවිත කරන ලදි.

ආරිය ලගමුව මහතා විසින් (2015) රචනා කරන ලද මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව යන කෘතියෙහි ද පොළොන්නරු රාජධානිය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රාශියක් එතුමා විසින් එහි ඇතුළත් කර ඇත. එම කෘතියෙහි වැඩි අවධානයක් යොමු කර ඇත්තේ පොළොන්නරුව පාළනය කළ රජවරුන් කෙරෙහි ය. එබැවින් මෙම කෘතිය ද මෙම පර්යේෂණය වෙනුවෙන් මෙම කෘතිය ද යොදා ගන්නා ලදි.

අමරදාස ලියනගමගේ මහතා විසින් (2002) රචනා කරන ලද මධ්‍ය කාලීන ලංකා ඉතිහාසය නම් කෘතියෙහි ද තොරතුරු ඇත්තේ පොළොන්නරු රාජධානිය සම්බන්ධයෙනි. එහි සමාජ හා ආර්ථික තත්වයන් කෙටියෙන් විග්‍රහ කර ඇති ආකාරයක් දක්නට ලැබේ. එබැවින් මෙම කෘතිය ද මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදි.

**පර්යේෂණ ගැටලුව**

පොළොන්නරු යුගයේ පැවති සමාජ හා ආර්ථික තත්වය කෙබදු ද? ඒ වෙනුවෙන් පොළොන්නරු යුගයේ සිටි රජවරුන් ගත් ක්‍රියාමාර්ග කවරේ ද?

**පර්යේෂණ අරමුණ**

පොළොන්නරු යුගයේ පැවති සමාජ හා ආර්ථික පසුබිම අධ්‍යයනය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

වඩාත් ගුණාත්මක භාවයෙන් යුක්ත පර්යේෂණයක් සිදුකිරීම සඳහා මෙහි දී භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීක මූලාශ්‍රය මගින් දත්ත රැස් කරමින්, එම දත්ත විශ්ලේෂණය කරමින් වඩාත් ඵලදායි මට්ටමින් මෙම පර්යේෂණය සිදු කරනු ලබයි.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම පර්යේෂණය තුළින් පොළොන්නරු යුගයේ පැවති සමාජ හා ආර්ථික පසුබිම පිළිබඳව මෙන් ම යහපත් ආර්ථිකයක් වර්ධනය කරගැනීම සඳහා රජවරුන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වෙයි.

**සාකච්ඡාව**

අනුරාධපුර රාජධානියේ බිඳවැටීමෙන් පසුව ශ්‍රී ලංකාවේ අගනගරය බවට පත් වූයේ පොළොන්නරුවයි. වංස කථාවලට අනුව විජිත නම් ඇමතියා විසින් පිහිටුවන ලද විජිතපුරය පොළොන්නරුවට ආසන්න ප්‍රදේශයක පිහිටා තිබේ. නූතන විජිතපුරය නමින් කලාවැව ආසන්නයේ පිහිටි නගරය පැරණි විජිතපුරයම යැයි ගයිගර් පවසයි. විජිතපුරය පිහිටා ඇත්තේ පොළොන්නරුවේ හෝ ඊට යාබද පෙදෙසකැයි පාකර් මහතා අනුමාන කරයි. දුටුගැමුණු රජතුමා අනුරාධපුරය ආක්‍රමණය කරන අවස්ථාවේ 'කන්දවාරපිට්ඨි' නම් ස්ථානයක කඳවුරු බැඳගෙන සිටි බව වංශ කථාවේ දැක්වේ. ක්‍රි. ව. 13වන සියවසේ දී රචිත කඳවුරු සිරිත නම් ග්‍රන්ථයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි. ව. 1236 - 1270) මෙම ප්‍රදේශයේ යුද කටයුතුවල නියැලී සිටි නිසා ඊට 'කඳවුරුපුර' යන නම භාවිත කළ බව සඳහන් වේ. පොළොන්නරුව යන නම කෙසේ භාවිතයට පත් වූයේ දැයි නිශ්චය වශයෙන් කිව නො හැකිය. (බස්නායක, 2015: 272).

ප්‍රංශ - ජර්මන් දෙරට අතර පැවති සෑම යුද්ධයකටම බැල්ජියම විනාශ වී ගියා සේ රුහුණු - පිහිටි දෙරට අතරේ කෙරුණු මහ සටන්වලට සුණු විසුණු වී ගියේ පොළොන්නරුවයි. මහා විජයබාහු රජතුමාගේ නියෝගයෙන් එතුමාගේ දේව නම් සෙනෙවියා විසින් පිහිට වූ වේළක්කාර සන්නසෙහි ද පොළොන්නරුව ගැන සඳහනක් එයි. මේ සන්නසෙහි ආරම්භයට ඇත්තේ සංස්කෘත ශ්ලෝකයකි. එහි නගර නාමය දැක්වූයේ 'පුලස්තිපුර' යනුවෙනි. පොළොන්නරු යුගයේ සෑම ශිලා ලේඛණයකම දැක්වෙන්නේ ද ඒ ලෙසිනි. ඉහත කී

වේළක්කාර සන්නස සංස්කෘත ශ්ලෝකයකින් ආරම්භ කොට දෙමළ භාෂාවෙන් ලියන ලද්දකි. එය දෙමළෙන් විස්තර කිරීමේ දී 'පුලනරියාන විජයරාජ පුර' යනුවෙන් පොළොන්නරුව හඳුන්වා දී තිබේ. 'පුලනරි' යනු 'පොළොන්නරු' යන්න දෙමළට පෙරළු සැටි ය. 'විජයරාජ පුර' යනු පොළොන්නරුව මහා විජයබාහු රජතුමා විසින් සොළීන්ගෙන් නිදහස් කරගෙන ඒ නගරයට තිබූ සිංහල නාමයයි. (වනරතන හිමි, 1962: 8). මෙලෙස 'විජයරාජ පුර' යනුවෙන් වේළක්කාර සෙල්ලිපියේ සඳහන් වන්නට ඇත්තේ පොළොන්නරු රාජධානියේ ආරම්භකරු පළමුවන විජයබාහු රජු වූ නිසාත් විය හැකිය. කෙසේ වෙතත් මෙම කරුණු සළකා බලන විට ගම්‍යවන කාරණය වන්නේ 'පොළොන්නරු' යන වචනය ක්‍රි. ව. 12වන සියවසේ සිට භාවිත වන්නට ඇති බවයි.

2004/07/04 වන දින පොළොන්නරු කෞතුකාගාරයේ පැවැත් වූ සම්මන්ත්‍රණයක දී අනුර මනතුංග මහතා 'පොළොන්නරු' යන වචනය සෑදී ඇති ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කළේය. එම විග්‍රහය ආරම්භ කරනුයේ පණ්ඩුකාභය කුමරු තම සේනාවට තවත් සෙබලුන් 500ක් කලහගල අසල නඟරයක දී එක් වූ බව සඳහන් කොට ඇති ප්‍රකාශයෙනි. වංසත්තප්පකාසිනිය එම නගරය කලහගල අසල පිහිටි පුරාණ නගරය බව සඳහන් කරයි. පණ්ඩුකාභය කුමරුගේ කථා ප්‍රවෘත්තියට පාදක වූ ගිරිකණ්ඩය (ගිරිතලය), කලහ නගර (කලහගල), ලෝහිතවාහ කණ්ඩය (ලොවිත නගර), දෝල පබ්බත (දෙලූගල), දුම්රග්ගල (දිඹුලාගල) ආදී ස්ථාන රාශියක් සඳහන් වෙයි. ඒ නගර දැන් හඳුනාගෙන ඇති අතර සියල්ලක්ම පිහිටියේ පොළොන්නරුව අසලයි. එසේ නම් පණ නගරය ද පොළොන්නරුව අසළ පිහිටිය යුතු බව ඒ මහතා පෙන්වා දෙයි. එම නගරය අන් කිසිවක් නොව පසුකලෙක අගනුවර බවට පත් වූ පොළොන්නරුව බව එතුමා අදහස් කරයි. පණ නගර පොළොන්නරු වූ ආකාරය මෙසේ විග්‍රහ කරයි.

'සිංහල භාෂා විකාශයේ දී 'ණ' යන්නට 'ළ' යන්න ආදේශ වීම සිදුවිය හැකිය. 'වණ' යන්න 'වළ' යනුවෙන් පෙරලෙනුයේ ද

මේ විකාශය අනුවයි. එහෙයින් 'පණ' 'පළ' බවටත්, 'පළ' 'පළෝ' බවටත් පත්වීම සිංහල ව්‍යාකරණ රීතිය අනුව ස්වභාවිකය. සිංහලයේ 'නරු' යන්න 'නගර' යන්නේ විකාශයක් බව ඉතා පැහැදිළිය. එහෙයින් පණ නගර පළනරු - පළොනරු - පොළොනරු - පොළොන්නරු බවට පත්විය හැකිය. (බාලසූරිය, 2007: 38,39).

උක්ත කරුණු විමසා බලන විට අපට සිතිය හැකි කාරණය වන්නේ 'පොළොන්නරු' යන වචනයේ ආරම්භය කොයි ආකාරයෙන් සිදු වී ඇත් ද යන්න පිළිබඳව විචාරකයින් අතර තවමත් ස්ථිර පිළිතුරක් නොමැති බවයි. පොළොන්නරු යුගයේ පැවති සාමාජ හා ආර්ථික පසුබිම පිළිබඳ මෙම පර්යේෂණය සිදුකරන හෙයින් යථොක්තව 'පොළොන්නරු' වචනය පිළිබඳ විමසීමක් කරන්නට යෙදුණි.

**සමාජ පසුබිම**

සරල සමාජ ක්‍රමයක් පැවති මේ සමයේ ආර්ථිකය, කුලය හා වෘත්තිය අනුව සමාජ තත්ත්වය හා ජීවන රටාව සකස් වී තිබුණි. සමාජයේ ඉහළ ම තත්ත්වය රාජරාජ මහාමාත්‍යාදීන්ට හිමි වූ අතර, භික්ෂූන් හා පූජකයන් පූජනීයත්වයෙන් සලකන ලදි. ධනවතුන් සියලු භව භෝග සම්පත් හා දැසි දසුන් ඇතිව ඉතා සැපවත් ජීවිත ගත කළේය. (ලගමුව, 2015: 53). වහල් (දාස) ක්‍රමය සමාජය පිළිගෙන තිබුණේය. සෑම වැදගත් පවුලකට ම වහලෙක් හෝ කිහිප දෙනෙක් සිටියහ. තමා විසින් හොඳ ආණ්ඩුවක් ඇති කරන ලදැයි කීමට නිශ්ශංකමල්ල රජු පෙන්වන එක් කරුණක්නම් රටවැසියන් ධනය පමණක් නොව දාසිදාසයන් ද අතැතිව ද සිටිය යුතු බවයි. ප්‍රධාන රදළවරුන්ගේ ගෙදරවල වහලුන් විසි තිස් ගණන් සිටියහ. 'ද්‍රවිඩාධිකාර' පදවිය කහඹල්කුළු මින්දල් (මහේන්ද්‍ර) නා තෙමේ බෙන්තොට විහාරයක් කරවා බොහෝ වහලුන් දන් දුන් අතර, මේ වහල්ලු දෙ කොටසකට අයත් වූහ. එනම්, පරපුරෙන් පැවත ආ වහල්ලු (අන්වයාගත වහල්) හා මිලදී ගනු ලැබූ නොහොත් තමන් ම මිල ගෙන වහල්කමට පත් වූ අය

(රන් වහල්) යන මොවුහු ය. මේ හැර විහාරයේ අරමුදල්වලින් ගන්නා ලද වහල්ලු ද වූහ. (පරණවිතාන (සංස්), 1972: 534).

පොළොන්නරු යුගයේ සමාජය කුලීන හා කුලහීන වශයෙන් බෙදී තිබූ බවට සාධක තිබේ. විජයබාහු රජතුමා ශ්‍රී පාද වන්දනාව සඳහා එන කුලහීන ජාතීන්ට පහතින් මළුවක් කරවූ බව දැක් වේ. සෙල්ලිපිවල දැක්වෙන 'එම කුලෙන් සමැදැ' යන වචන නිසා කුලය ගැන සැලකීමක් තිබූ බව පෙනේ. ආයස්මන්ත සෙනෙවියා විසින් චතුර්වර්ණය අසංකීර්ණ වන සේ ධර්මාධිකරණ ශාස්ත්‍රයක් කරවීම ද මේ යුගයේ වර්ණ භේදය පැවති බව දැක්වීමට තවත් සාධකයකි. එසේ ම ඒ ඒ කුල චාරිත්‍ර ආරක්ෂා කිරීමට ඇතැම් සෙල්ලිපිවල නියම කර තිබීම ද තවත් සුවිශේෂී සාක්ෂියක් සේ ගිණිය හැකිය. සමාජයේ වරප්‍රසාද බුක්ති වින්ද රජ පවුල, සංඝයා වහන්සේලා සහ බ්‍රාහ්මණයන් ළගට සමාජයේ වැදගත් තැන ලැබුණේ කුලීන ගණයට අයත් පිරිසටයි. පාරම්පරිකව හිමි වුණු 'පමුණු' ඉඩම්වල අයිතිකරුවන් වීම මීට හේතුවයි. (බස්නායක, 2015: 353). එක්තරා ඉඩම් වගයකින් බදු අය කරගැනීමේ අයිතිය ඇතිව සිටි අය කුලීන නම් වූහ. රාජකීය සේවයේ වැදගත් තනතුරුවලට පුද්ගලයන් තෝරාගන්නා ලද්දේ මේ කුලීනයන් අතුරිනි. මේ කුලීනයෝ නම් ගොවි කුලයේ අයම යැයි සිතීමට ඉඩ තිබේ. මේ ගොවි කුලය එක්තරා කාලයක දී බෙහෙවින් බලවත් වූ හෙයින් ඒ කුලයේ කිසිවෙකුට සිංහාසනාරූඪ වීමට ඉඩ නො තබන ලෙස රටවැසියන්ට උපදෙස් දීමත්, ඒ කුලයට ගැරහීමත් අවශ්‍ය යැයි නිශ්ශංකමල්ල රජු කල්පනා කළේය. එකල රජවරු කුලීනයන් පරිහාණියට පත් කොට මහත්වකාමී හීන ජනයන් උසස් තනතුරුවලට පත් කිරීම පිළිබඳව බෞද්ධ වංශකථාකරුවන්ට ඇත්තේ ඉමහත් දොම්නසකි. පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ රජ වූ පසු ක්‍රියාවේ යෙදූ ප්‍රතිපත්තියනම් ඔහුට පෙර රජකම් කළ රජවරුන් විසින් ධනය හා තත්ත්වය නැති කර දමනු ලැබූ කුලීනයන්ගේ දරු මුනුබුරන්ට ඒ සියල්ල නැවත ලබා දීමය. රාජ්‍ය සේවයට පත්කර ගැනීමේ දී උසස් යැයි සම්මතව පැවති කුලවල

අයට වැඩි සැලකිලි දැක්වීම එකල සිරිත වූ බව මෙයින් පෙනේ. (පරණවිතාන (සංස්), 1972ඃ 533).

පොළොන්නරු යුගයේ කුල ක්‍රමය පැවති බවට සාධක ගලපාත විහාර ශිලා ලිපියෙන් හමු වේ. එහි කෙවුළු කුලයත්, බරවා කුලයත් ගැන සඳහන් වේ. යුද බටයන්ට ආයුධ සෑදූ ලෝකුරුවන් ගැන කියවෙන නිසා ලෝකුරු කුලයක් තිබූ බව පැහැදිලි වේ. ජයබාහු රජුගේ කාලයට අයත් ආඥා ලිපියකින් කම්මල්කරුවන්ට විශේෂ වරප්‍රසාද දුන් බව කියවේ. (බස්නායක, 2015ඃ 353). රජතුමා, තමන් වැදගත් කොට සැලකීම යුක්ති යුක්ත බව ඔප්පු කිරීමට මේ ශිල්පීන් වෑයම් කළ බව පෙනේ. ලංකාවේ සාදන ලද කඩු චිරප්‍රසිද්ධියට පත් වී තිබුණේ ය. පරාක්‍රමබාහු රජු ද පිටරටින් ආනයනය කරන ලද කඩුවලට වඩා වැඩි රුචියක් දැක්වූයේ ලංකාවේ නිෂ්පාදනය කරන ලද කඩුවලට ය. සටනට ඒවා ඉතා හොඳ බව ඔහුගේ සම්පූර්ණ විශ්වාසය විය. එක් කුලයක් විසින් වෙනත් කුලයකට කළ යුතු වූ සේවය පිළිබඳව සමහර කාලවල දී ආරවුල් ඇති විය. නිදසුනක් ලෙස ලෝකුරුවරුන්ට සමහර වැඩ කරදීමට බැරි යැයි ජයබාහු රජුගේ අටවන රාජ්‍ය වර්ෂයේ දී රජකයන් කියා සිටීම ය. මේ වැඩ නම් යුවතියන් වැඩිවියට පැමිණි විට රෙදි ගෙනත් දීම, උත්සවවලදී පාවඩ දැමීම හා මළ මිනී මුහුණු වැසීම සඳහා රෙදි ගෙනත් දීමයි. මේ නඩුව ඇසූ පඤ්ච ප්‍රධානි නමැති උසාවිය ලෝකුරුවරුන්ගේ වාසියට තීන්දුව දී මේ වැඩ නො කඩවා කරන ලෙස රජකයන්ට නියම කළේය. (පරණවිතාන (සංස්), 1972ඃ 533).

ආවාහ විවාහ සිදු වූයේ ද කුලය තුළ ම ය. (පරණවිතාන (සංස්), 1972ඃ 534). රුහුණේ විසූ සිරිවල්ලභ රජු රත්නාවලී බිසවගේ දියණියක් වන මිත්‍රා කුමරිය තම පුත් මානාභරණට සරණ බන්ධනය කරදීම සඳහා සාකච්ඡා කළ අවස්ථාවේ දී වංශය අනුව නො ගැළපෙන බව දක්වමින් රත්නාවලී බිසව ඊට විරුද්ධත්වය දැක්වීම මීට කදිම නිදසුනකි. මංගල උත්සව ද බොහෝ විට වේද චාරිත්‍රවලට අනුව සිදුකොට තිබේ. සුබ මොහොතින් කටයුතු කිරීම ගැන තදබල විශ්වාසයක් පැවතිණි. පරාක්‍රමබාහු

රජතුමා සුබ මුහුර්ති ගැන තදින් විශ්වාස කළ බවට සාධක ඇත. පොළොන්නරුව වටකොට ගජබාහු රජු සිරභාරයේ තබාගත් අවස්ථාවේ දී පවා පරාක්‍රමබාහු රජු සුබ මොහොතක් එනතුරු ගජබා රජු මුණගැසීම ප්‍රමාද කළ බව සඳහන් වේ. (බස්නායක, 2015: 354). පොළොන්නරු යුගයේ අවැස්ස විවාහ හා බහුභාර්යා විවාහ පැවතිණි. (ආරියපාල, 2014: 290-293). විජයබාහු රජුට ජගතිපාලගේ දියණියන් වූ ලීලාවති කුමරිය මෙන් ම කාලිංසයෙන් ගෙන්වාගත් තිලෝක සුන්දරී නම් කුමරිය ද බිසෝවරු වූහ. මෙරට සමකුල බිසෝවරු මෙන් ම වෙන රටවලින් බිසෝවරු ගෙන්වා ගැනීම විජයබාහු රජු අනුගමනය කළ සිරිතකි. පරාක්‍රමබාහු රජුට ලීලාවතී හා රූපවතී යනුවෙන් බිසෝවරු දෙදෙනෙක් ද, නිශ්ශංකමල්ල රජුට සුභද්‍රා හා කල්‍යාණවතී නමින් බිසෝවරු දෙදෙනෙක් ද සිටි බවට සාධක ඇත. (බස්නායක, 2015: 355).

පොළොන්නරු යුගයේ නිවාස ඉදිකිරීම ආර්ථිකය මත සකස් වී තිබුණි. රජ පවුලේ අයට මාලිගා ද, ධනවතුන්ට ගඩොලින් ඉදි කළ, බදාම පිරියම් කළ, සුදු හුණු ගා උළු සෙවිලි කළ උඩු මහල් ද සහිත විශාල නිවාස තිබුණේ ය. සියලු පහසුකම්වලින් අනූන ඒවායේ ඒ ඒ කාර්යයන් සඳහා වෙන වෙන ම ස්ථාන තිබුණි. ගේට්ටු හා වට තාප්පවලින් එම ගෙවල් ආරක්ෂා වී තිබුණි. දිළින්දන්ගේ ගෙවල් වරිච්චි බිත්තිවලින් හා අතු සෙවිලි කළ පියසිවලින් යුක්ත කුඩා ඒවා විය. එහි අවම පහසුකම්වත් නො තිබූ අතර, සතුන්ගෙන් ආරක්ෂා වීමට ගෙය වටා දඬු වැටක් පමණක් තිබුණි. (ලගමුව, 2015: 54).

මීට පෙර සියවස්වල රජුන් මෙන් මේ යුගයේ රජවරුන් ද ලෙඩුන්ට හා දිළින්දන්ට පිහිට වීම තමන් සතු යුතුකමකැයි සැලකූහ. පරාක්‍රමබාහු රජතුමා විසින් රාජධානියේ පිහිටුවන ලද රෝහලක් පිළිබඳ මනහර වර්ණනාවක් චූලවංශයේ දැක් වේ. මේ රෝහලට පැමිණි රෝගීන් උපස්ථායක, උපස්ථායිකාවන්ගේ සාත්තුව හා බෙහෙත් ලැබූහ. රජතුමා මේ ගැන මහත් උනන්දුවක් දැක් වූ බවත්, නිතර එහි පැමිණ සොයා බලමින් රෝගීන්ගේ සුව දුක් විමසූ බවත්, සමහර රෝගීන්ට තමා ම ප්‍රතිකාර කළ බවත්

කියා තිබේ. රෝගාතුර වූ සිවුපාවුන්ට ද මෙහි දී ප්‍රතිකාර කරන ලදි. චූලවංශයේ සඳහන් මේ තොරතුරු සැබෑ බව අනුරාධපුරයේ සොයා ගෙන තිබෙන අප්‍රකාශිත ශිලා ලිපියකින් ඔප්පු වේ. උප ප්‍රධාන වෛද්‍යවරයා විසින් (සුළු වෙදනා) නගරයේ පිහිටුවන ලද ආරෝග්‍යශාලාවකට (ආතුර ශාලා) දේපළ පරිත්‍යාග කරන ලද බව එහි සඳහන් වේ. (පරණවිතාන (සංස්), 1972: 534). දුප්පතුන්ට, මඟීන්ට හා අසරණයන්ට ආහාරපාන දීම සඳහා පරාක්‍රමබාහු රජතුමාත්, නිශ්ශංකමල්ල රජතුමාත් දාන ශාලා කරවූ බව සඳහන් වේ. අනුරාධපුරයේ දාන ශාලාවක් කර වූ ලීලාවතී රැජිණ එහි දන්දීමට අවශ්‍ය භාණ්ඩ සපයා ගැනීමට නානදේශී වෙළෙන්දන්ගෙන් බදු අයකළ බව සෙල්ලිපියක සඳහන් වේ. මේ අනුව බලනවිට සමාජ සුබ සාධක කටයුතු කිරීම ද රාජ්‍ය ප්‍රතිපත්තියේ වැදගත් අංගයක් වූ බව ගම්‍යමාන වේ. (බස්නායක, 2015: 356).

**ආර්ථික තත්ත්වය**

රටක පැවැත්ම පවතිනුයේ එම රට තුළ ස්ථිර ආර්ථිකයක් පැවතියොත් පමණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටිය ද, ශ්‍රී ලාංකේය ඉතිහාසය විමසා බැලීමේ දී මෙවැනි ආර්ථික අර්බුදයක් එකළ සමාජය තුළ නො තිබූ බවට සාධක දැකිය හැකිය. අනුරාධපුර යුගයේ මෙන් ම පොළොන්නරු යුගයේ ද ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. ඊට අවශ්‍ය වැව් තැනීමේ කර්මාන්තයත්, වාරි ක්‍රමයත් පෙර යුගයට වඩා උසස් තත්ත්වයකින් පවත්වාගෙන යෑමට රජවරු කටයුතු කළහ. දශක හතක පමණ කාලයක් තුළ චෝළ ආධිපත්‍යය මෙරට පැවති නිසා වාරි ක්‍රමයේ පරිපාලනය බොහෝ දුරට අඩාල වූ බව සිතාගත හැකිය. එහෙත් කෘෂිකර්මාන්තය සම්පූර්ණයෙන් ම අඩාල නො වී ජනතාවට අවශ්‍ය ආහාරපාන නිශ්පාදනය කරගැනීමට හැකිවන පරිදි වාරි ක්‍රමය චෝළයන් විසින් පවත්වාගෙන එන්න ඇතැයි සිතිය හැක. කෙසේ වෙතත් රට මුදවා ගැනීමේ සටන්වලදී එක්තරා ප්‍රමාණයකට වාරි ක්‍රම විනාශ වී යාමේ තත්ත්වයකට පත්වන්නට ඇතැයි සැලකිය හැකිය.

## පළමුවන විජයබාහු රජතුමා

විජයබාහු රජු චෝළ ආධිපත්‍යයෙන් රට මුදවා ගන්නා විට පැරණි ආර්ථික අඩිතාලම සම්පූර්ණයෙන් බිඳී ගොස් රට දීන තත්ත්වයකට පත්ව තිබූ බව වංශ කථාව දක්වයි. ඒ නිසා ඔහු වැව් ගණනාවක් ම සංවර්ධනය කළ බව පෙනේ. ඉන් සමහරක්නම් මහාහේළී, මහාදත්ති, කටුන්නරු, පණ්ඩවාපි, කළලහල්ලික, ඒණේඩගල්ල, දීඝවත්ථුක, මණ්ඩවාටක, කිත්ථබෝධි පබ්බත, වලාහස්ස, මහාදාරගල්ල, කුම්භිල සොම්භක, පත්ථකපාසාන හා පාන යනුවෙන් හැඳින් වේ. (බස්නායක, 2015: 356).

පොළොන්නරු ප්‍රදේශයේ හා ඒ අවට පිහිටි බ්‍රාහ්මී ශිලා ලේඛනයන්ට අනුව පැරණි භික්ෂූන් වහන්සේලා එහි වාසස්ථාන පිහිටුවා ගත් අතර, සාමාන්‍ය ජනතාව ඔවුනට අනුග්‍රහය දැක්වීය. ඔවුහු සාමාන්‍යයෙන් කෘෂිකාර්මික ජනකොටසක් වූ අතර, ක්‍රමානුකූලව තම වෘත්තිය හා බැඳුණු වාරිමාර්ග පද්ධතියක් ආරම්භයේ දී ඔවුන් සතුව තිබෙන්නට ඇත. ප්‍රදේශයේ සෑම තැනක ම දක්නා පරිද්දෙන් රජරට වියළි කළාපය පුරා පිහිටි සෑම ග්‍රාමයක ම කුඩා පරිමාණයේ වැවක් බැගින් පිහිටියේ ය. ක්‍රි. පූ. 1වන සියවසේ දී වාරි ශිෂ්ටාචාරයෙහි පොදු ලක්ෂණයක් වූයේ ගමක් පාසා වැවක් ඉදිවීමයි. දිවයිනේ පිහිටි බොහෝමයක් පැරණි බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි ඉඩම් හා වැව් ඇල මාර්ග යන්ට උරුම්කම් කී දිස්ත්‍රික්ක පරිපාලනය හා බුද්ධ ශාසනයේ අභිවෘද්ධියට අනුග්‍රහය දැක් වූ සංස්ථාවකට අයත් සාමාජිකයෝ වූහ. පරණවිතාන මහතාට අනුව මෙකී පරුමකවරුන් වූ කලී මෙරට වාරිමාර්ග හා වෙළහෙළදාම් කටයුතු ආරම්භ කර ස්ථූප ගොඩ නගා භික්ෂූන්ගේ ආධ්‍යාත්මික ජීවිතයට මහෝපකාරී වූ ලෙන් සකසා බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා අනුපම සේවයක් කළ ජන කොට්ඨාසයකි. කෙටියෙන් දක්වතොත් ඔවුහු මූලාරම්භයේ දී ලක්දිව ආර්ථික, දේශපාලනික, ආගමික හා සංස්කෘතික ජීවිතයක් නඟාසිටුවීම පිණිස පදනම දැමූ ජන කොටස වූහ. (සෙනෙවිරත්න, 2005: 233).

පළමුවන විජයබාහු රජු සොළීන්ගෙන් රට මුදවාගත් පසු එතුමාට ප්‍රථමයෙන් ම ඉටුකිරීමට සිදු වූයේ රට යථා තත්ත්වයට පත් කිරීමයි. විදේශිකයන්ගෙන් පීඩා විඳිමින් අසාධාරණ බදු පීඩණයකට ලක් වූ දේශීය ජනතාව වෙත සාධාරණ බදු ක්‍රමයක් ආරම්භ කිරීමට රජු ක්ෂණිකව ක්‍රියා කරන ලදි. මේ වන විට අනුරාධපුර ආර්ථිකය සොළී ආක්‍රමණවල ප්‍රතිඵලයක් වශයෙන් අන්තයට ම පිරිහී තිබුණි. මෙම බිඳවැටී තිබූ ආර්ථිකය ගොඩනැගීමට මහත් ආයාසයක් දැරීමට රජුට සිදු විය. මේ සඳහා කෘෂිකාර්මික පදනම වහා යථාස්ථානයට පත් කිරීමට විජයබාහු රජු උත්සාහ ගන්නා ලදි. මේ නිසා සොළීන් විසින් විනාශ කර දමා තිබූ වැව් නැවත පිළිසකර කිරීමට ඔහුට සිදු විය. බොහෝ ගංගා හා නිතර ජලය ඇදී ගිය ඔයවල් හරස් කරමින් ඒවා හරහා අමුණු බඳිමින් කුඩා වැව් ආරම්භ කළ බව ද, ඒවායින් ජලය ලබාගත් බව ද සඳහන් කළ හැකිය. මේ අනුව අන්තයට පිරිහී ගොස් තිබූ රජරට ආර්ථිකය නැවත නඟා සිටුවීමට විජයබාහු රජුට හැකි වූ බව පෙන්වා දිය හැකිය.

ආර්ථිකය ගොඩනැඟීමෙහිලා විදේශ රාජ්‍යයන් සමඟ රාජ්‍ය සම්බන්ධතා පවත්වමින් ජාත්‍යන්තර වාණිජ්‍ය කටයුතු ආරම්භ කිරීම මෙතුමා ගත් විශිෂ්ට තීරණයකි. කාම්බෝජය, සියමය, චීනය වැනි රාජ්‍යයන් සමඟ වෙළඳාම සංවිධානාත්මකව පවත්වාගෙන ගිය අතර, ඒ තුළින් ලැබූ ආර්ථික ප්‍රබෝධයේ ප්‍රතිඵලය වූයේ විනාශ මුඛයට පත්ව තිබූ වෙහෙර විහාර ආදිය ප්‍රතිසංස්කරණය කිරීමත්, පොළොන්නරුවේ නවතම ආගමික ගොඩනැගිලි ඉදිකිරීමත් ය. එසේම අනුරාධපුරයේ චෝළ ආක්‍රමණිකයන් විසින් විනාශ කරන ලද ආගමික ගොඩනැගිලි විජයබාහු රජු ස්වකීය ශක්තිය යොදා පිළිසකර කරවීමෙන් පෙනීයන්නේ ඔහු වැඩිකල් නොගොස්ම ඔහුගේ ජාතික ආර්ථික ව්‍යූහය ශක්තිමත් කළ බවයි.

දළදා මාළිගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ඔහු විසින් කළ බව සඳහන් වේ. පොළොන්නරු අටදාගෙය ඔහුගේ ආර්ථික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූවක් බව පෙන්වා දිය හැක. මේ

හැරුණු විට සොළීන් විසින් පැහැරගන්නා ලද දේපළ නැවත භික්ෂූන් වහන්සේලාට පැවරීමෙන් පෙනීයන්නේ ඔහු වැඩිකල් නො ගොස් ම ඔහුගේ ආර්ථික ශක්තිය දියුණු කරගත් බවයි. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඔහු ආදායම් ඉපයිය හැකි ඉඩකඩම් ද පූජා කළ බව සඳහන් වේ. බුරුමය, රක්ඛංග දේශය වැනි රාජ්‍යවලින් ධර්මධර භික්ෂූන් වහන්සේලා ගෙන්වා ධර්ම ශාස්ත්‍රීය කටයුතු දියුණු කරවීම, විවිධ ධර්ම ග්‍රන්ථ කරවීම සඳහා භික්ෂූන් වහන්සේලාට උපදෙස් ලබා දුන්නේය. ධර්මසංග නීප්‍රකරණය සිංහලට පරිවර්තනය කරන ලද්දේ විජයබාහු රජුගේ ආරාධනය පරිදිය. (කහඳවආරච්චි, 2004: 241,242).

රජුගේ අණ පරිදි අලුත් රාජධානිය වටා අට්ටාල සහිත දැඩි පවුරක් ද ඒ වටා දිය අගලක් ද කරවන ලද්දේය. විජයබාහු රජතුමාගේ මාලිගාව වනාහි අලුත් රාජධානිය තුළ මුලදී ම කරවන ලද ගොඩනැගිලිවලින් එකක් බව අනුමාන කළ හැකිය. හෙතෙම මාලිගා භූමියට නුදුරු ව උතුරු පැත්තෙන් දළදා මැදුරක් කරවීය. (පරණවිතාන (සංස්), 1972: 409). මෙලෙස සොළීන්ගෙන් රට මුදවාගත් සැනින් තම රාජධානිය දියුණු කිරීමට තරම් විශාල ධනයක් භාණ්ඩාගාරය තුළ පැවති බව සිතිය හැකිය.

කර්ණාට දූත පිරිස හා සිංහල දූත පිරිස චෝළ රට හරහා කර්ණාට රටට ගමන් කරද්දි චෝළයන් විසින් සිංහල දූත පිරිස අල්වාගෙන කන්, නාසා කපා දමා හිංසා පීඩා කළහ. මෙසේ විකලාංගව ලංකාවට පෙරළා පැමිණි සිංහල දූතයෝ විජයබාහු රජතුමාට එපවත් සැල කර සිටියහ. කෝපයට පැමිණි රජතුමා චෝළ දූතයන් කැඳවා තමාගේ යුද්ධාභියෝගය චෝළ රජුට දන්වන ලෙස නියමම කර, ගැහැණු ඇඳුම් අඳවා ඔවුන් පෙරළා යැවීය. ඉක්බිති සේනාව රැගෙන අනුරාධපුරයට ගිය රජතුමා සේනාපතිවරුන් දෙදෙනකු ප්‍රධාන කොට ඇති හමුදා දෙකක් මහාතිත්ථ, මත්තිකාවාටතිත්ථ යන දෙ තොටට පිටත් කර යැවීය. එතැන් සිට නැව් නැගී ගොස් චෝළ රාජ්‍ය ආක්‍රමණය කිරීමට ඒ සේනාවන්ට නියම කරන ලදි. මේ භටයන්ට උවමනා ආහාරපාන සපයා දී නැව් නැංවීම සඳහා කටයුතු සූදානම් කළේය. (පරණවිතාන (සංස්), 1972: 412). මෙලෙස විදේශ රාජ්‍යයන් සමඟ

යුද්ධ කිරීමටත්, එම යුද්ධයන් සඳහා පිටත්ව යන සේනාවන්ට අවශ්‍යකරන ආහාරපානාදිය සැපයීමටත් තරම් පොහොසත් ආර්ථිකයක් විජයබාහු රාජ්‍ය සමයේ පැවතියේ ය.

**පළමුවන පරාක්‍රමබාහු රජතුමා**

විජයබාහු රජතුමාගේ අභාවයෙන් පසු රට නැවත පරිහාණිය කරා ගමන් කරන්නට වූයේ එතැන් පටන් පොළොන්නරුවේ රජ වූ රජවරුන් අධික තණ්හාවෙන් තම රාජ්‍ය පවත්වාගෙන ගිය නිසාවෙනි. අධික ලෙස බදු මුදල් අය කිරීම, දේපළ මංකොල්ලකෑම ඔවුන්ගේ සිරිත විය. මෙලෙස රට ව්‍යාකූලත්වයට පත්ව තිබූ අතර, එම ව්‍යාකූලත්වයෙන් නැවත රට මුදවා ගනු ලැබුවේ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසිනි. එතුමා විසින් ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තය දියුණු කිරීම පිණිස වාරි කර්මාන්තය නඟා සිටුවමින් රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නට විය. පළමුවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨතම ජාතික වීරයෙකු වශයෙන් අද දක්වා ම ලංකා ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වී සිටියි. දේශපාලන, ආර්ථික හා ආගමික අංශයන්හිලා එතුමාගෙන් සිදු වූ සේවය චූලවංශයේ ප්‍රශංසා මුඛයෙන් විස්තර කොට ඇත. (ලියනගමගේ, 2002ඃ 56). මහා පරාක්‍රමබාහු රජතුමන් විසින් අරඹන ලද බොහෝ වූ ද, විවිධ වූ ද ප්‍රතිසංස්කරණ සංවර්ධනය සහ නව නිර්මාණ කාර්යයන්ගේ විධානය සහ කරවීම එකකට එකක් වෙනස්, එහෙත් ළඟ ළඟම ඇති කාල පරිච්ඡේද දෙකකට අයිති වේ. මින් පළමුවැන්න නම් 'සරජ්ජ සමිද්ධි කරණ' නම් වූ චූලවංශයේ 68වන පරිච්ඡේදයෙන් විස්තර කරන ලද එතුමා දක්ඛිණ දේශාධිපතිව සිටි කාලයයි. දෙවැන්න වනුයේ එතුමා මුළුමහත් දිවයිනට අගරජව සිටි කාලයයි. (නිකොලස්, 1966ඃ 61).

ආර්ථික තත්ත්වය දියුණු කිරීමේ අභිලාෂය ඇතිව පරාක්‍රමබාහු රජතුමා කෘෂි සම්පත් දියුණු කරවීමට පටන් ගත්තේය. විශාල ප්‍රදේශයක් අලුතෙන් වගා කරවා නිෂ්පාදනය වැඩි කරවනු සඳහා ජලානයන ව්‍යාපාර කිහිපයක් ආරම්භ කළහ. රට දියුණු කිරීම සඳහා අලුතෙන් පටන් ගන්නා ලද මේ උතුම් වැඩ පිළිවලේ

මූලික අවස්ථාවේ රජතුමා විසින් කියන ලදැයි සඳහන් වන කියමනක්නම්, 'මෙබඳු රටෙහි වැස්සෙන් හටගත් ජලය මඳකුත් ලෝකෝපකාරයෙන් තොරව කිසි කලෙක සාගරයට නොයේවා' යනුවෙනි. මේ වැඩ කටයුතුවල අරමුණ වූයේ ධන ධාන්‍ය සම්පත් දියුණු කොට දක්ඛිණ දේශය ලංකාවේ රාජ්‍ය තුන අතුරින් ඉතා බලසම්පන්න රාජ්‍යය බවට පැමිණවීමය. (පරණවිතාන (සංස්), 1972: 423).

පැරකුම්ගේ කෘෂිකාර්මික සේවාවන් පිළිබඳව පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය වන්නේ ලක්දිව විශාල ධාරිතාවකින් යුත් වැව් කරවා තිබෙන්නේ ද මහ පැරකුම් රජතුමා බව ය. ඒ අනුව ඔහුගේ වැව් කර්මාන්තය කෙතරම්දැයි පෙනී යනු ඇත. ඔහු වාරිමාර්ග ඉංජිනේරු ශිල්පය මනාව ප්‍රගුණ කළ බව ද පෙනේ. (කහඳවආරච්චි, 1995: 206). ඔහුගේ රාජ්‍ය සමයේ දී අන් කිසිදු පාලකයෙකුට සම කළ නො හැකි පරිද්දෙන් වේලි 165ක්, ඇළ මාර්ග 3910ක්, විශාල ජලාශ 163ක් සහ කුඩා ජලාශ 2376ක් ඉදි කළ බව හෝ ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වේ. (සෙනෙවිරත්න, 2005: 246). සංවර්ධන ව්‍යාපාරය පටන්ගන්නා ලද්දේ ප්‍රධාන වශයෙන් ම ජජ්ජරනදිය (දැදුරු ඔය) අවට පෙදෙසේය. එහෙත් තෙත් කලාපය ද එයට ඇතුළත් විය. මඩ වගුරු සහිතව මහ කැලයක් ව තිබුණු පංචයෝජන රටෙහි (කළුතර දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර ප්‍රදේශයක් වූ පස්දුන් කෝරළේ) ගොහොරු බිම්වල ජලය ගලා යන්නට සලස්වා විශාල ප්‍රදේශයක් අලුතෙන් අස්වද්දන ලදි. රටේ මැද හරියේ පිහිටි පරාක්‍රමපුරය (හෙට්ටිපොල අසළ පඬුවස්නුවර) රාජධානිය කරගත් හෙතෙම පණ්ඩවාපි නමින් ප්‍රකට කුඩා වැව ලොකු කරවා විශාල ජලාශයක් තැනවීය. (පරණවිතාන (සංස්), 1972: 424). කොළමුණ ඔය හරහා සැතැපුම් එකහ මාරක් පමණ එහි කණ්ඩිය දික්කොට එය අඩි 24ක් උස් කිරීමෙන් අක්කර 1000 සිට 1200 දක්වා බිම් ප්‍රමාණයක් යටවන සේ මේ වැව පැරකුම්බාවන් විසින් බොහෝ සේ විශාල කරවන ලද්දේ ය. මේ වැව මැද පිහිටි දූපතක එතුමන් විසින් විනෝදය සඳහා තුන් මහල් රජ මැදුරක් ද, ගලක් මුදුනෙහි සෑයක් ද කරවන ලදි. 1805 දී මහ වතුරකින් කැඩී ගිය මේ බැම්ම තවමත් එසේම පවතී. අභිනව අගනුවරෙහි පිහිටි මේ වැවට එතුමා පරාක්‍රම සමුද්‍ර යන

නම තැබීය. මේ වනාහි ප්‍රථම පරාක්‍රම සමුද්‍රයයි. මෙය බැන සමුද්‍ර හෙත් බැන යන නමින් ද හඳුන්වනු ලැබේ. එතුමා ලක්දිව අගරජු වූ පසු මීට වඩා බෙහෙවින් විශාල වූ දෙවන පරාක්‍රම සමුද්‍රයක් පොළොන්නරුවෙහි කරවීය. (නිකොලස්, 1966ඃ 66).

මධ්‍යකාලීන ලක්දිව විශාලතම වාරිකර්මාන්තය අතරින් එකක් වන පරාක්‍රම සමුද්‍රය පොළොන්නරුවේ පිහිටි විශාලතම වැව ද වෙයි. තෝපා වැව හා තවත් වැව් දෙකක් සම්බන්ධ කර පරාක්‍රමබාහු රජු විසින් (ක්‍රි. ව. 1153-1186) ඉදි කරවන ලද මෙය ප්‍රමාණයෙන් වර්ග සැතපුම් 9ක් හෙවත් අක්කර 2350ක් විශාල වන අතර, ඝන මීටර් දශ ලක්ෂ 134ක ධාරිතාවකින් යුක්ත වේ. මෙහි වැව් බැම්ම සැතපුම් 8 1/2ක් දිගකින් හා අඩි 40ක් උසකින් ද යුක්ත වෙයි. මෙහි ජලයෙන් කුඹුරු අක්කර 18,200ක් හෙවත් වර්ග සැතපුම් 28ක් වගා කරනු ලැබේ. කාර ගංගා හෙවත් කරගඟ (අඹන් ගඟ) හරස් කර අංගමැඩිල්ල වේල්ල බැද අංගමැඩිල්ල ඇළ (ආකාශ ගංගාව) ඔස්සේ වැවට ජලය සපයනු ලැබේ. ගිරිතලේ වැවෙන් ද පරාක්‍රම සමුද්‍රයට අමතර ජලය ලැබෙන අතර, විශාල වාරිමාර්ග දෙකක් ද එමඟින් සම්බන්ධ වී ඇත. මෙහි පැරණි බිසෝ කොටු නටබුන්ව ඇතත් නව ඇළ මාර්ග ඔස්සේ ජලය බෙදා හරියි. වැවට සොරෝව් 7ක් ද, ඇළ මාර්ග 11ක් ද තිබූ බව සඳහන් වෙයි. 'වැව් රජ' යන අන්වර්ථ නාමයෙන් ද හඳුන්වා තිබෙන පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්මේ මිනුම් කණු සිටුවා ඇති අතර, ඒවායේ දෙපැත්තක සිංහල හා සංස්කෘත භාෂාවලින් පළමුවන පරාක්‍රමබාහු මෙය කරවූ බව සඳහන් වෙයි. (ලගමුව, 2015ඃ 60).

පරාක්‍රමබාහු රජතුමා විසින් රාජ්‍යයේ පරිපාලනය ප්‍රතිසංවිධානය කරන ලද්දේ ය. ප්‍රධාන රාජ්‍ය නිළධාරීන් දෙදෙනකු පාලනය භාරව සිටි බව වංශකථාවේ සඳහන් වේ. ඔවුනතුරෙන් සේනාපතියා සේනාව හා යුද්ධ කාර්යය භාරව සිටි බව සිතිය හැකිය. අනෙක් නිළධාරියාගේ පදවි නාමය සඳහන් කර නැත. හෙතෙම මුදල් කටයුතු භාරව සිටියේය. ඒ හැර රටේ පාලනය පොදුවේ ඔහු භාරයේ පවතින්නට ඇත. පසුව සඳහන් කළ

මේ නිළධාරියා යටතේ ප්‍රධාන ගණකාධිකාරිවරු (ගණකාමච්ච) දෙදෙනෙක් සිටියහ. රාජ්‍යයෙන් භාගයක් එක් කෙනෙකුට ද, අනෙක් භාගය අනෙකාට ද භාරව තිබුණේ ය. කනිෂ්ඨ පදවිවලදී තම කාර්යක්ෂමභාවය ඔප්පු කිරීමෙන් මේ තත්ත්වයට පැමිණි ඔවුන් දෙදෙනා මුදල් කටයුතු පිළිබඳ නියෝජ්‍ය නිළධාරීන් වූහ. මැණික්, ලෝහ වර්ග හා ඛනිජ වර්ග ඇතුළත් හෙයින්දෝ ඉතා ඉහළ වටිනාකම් ඇතිව තිබුණු ඉඩම්, අභ්‍යන්තරය පිළිබඳ කාර්යාලයේ ප්‍රධානියාට (අන්තරංගධුර) භාරව පැවතුණේය. මුදලින් හා ද්‍රව්‍යවලින් අයබදු එකතු කිරීමත්, ඒවා පරිස්සම් කිරීමත් භාණ්ඩාගාරිකවරුන්ට හා ගබඩාකරුවන්ට (භාණ්ඩාගාරාධිකාරී) පවරා තිබුණේය. පිටරටවල් සමඟ වෙළඳ ගනුදෙනු පටන් ගන්නා ලද්දේ ය. එසේම මැණික් වර්ග පිටරට යවන ලද්දේ ය. මේ රාජ්‍යයේ ප්‍රධාන මුහුදු තොටමුණ වන්නට ඇත්තේ (කලා ඔය මුවදොර අසල) උරුවේලාව, කල්පිටිය හා කොළඹය. පිටරටවල් සමඟ පැවති වෙළඳාම රජතුමාගේ ධනය මුදල් අතින් බෙහෙවින් වැඩිවීමට හේතු විය. (පරණවිතාන (සංස්), 1972: 424).

### කෘෂිකර්මාන්තය

විජයබාහු රජු හා පරාක්‍රමබාහු රජු මහ පරිමාණයේ වැව් නිර්මාණය හා ප්‍රතිසංස්කරණය කරන්නට යෙදුනේ රටේ ප්‍රධාන ආර්ථිකය කෘෂිකර්මාන්තය වූ නිසාවෙනි. එබැවින් අනුරාධපුර යුගයට වඩා සුවිශාල සංකීර්ණ ජලානයන ව්‍යාපාර මේ යුගයේ ආරම්භ කරන්නට යෙදුණි. ප්‍රධාන වී වගාවට අමතරව පොල් වගාව ද මේ යුගයේ ආරම්භ කළ බව පෙනේ. තල්, කිතුල්, පුවක් වැනි වැවිලි ද වගා කොට තිබූ බවට සාධක ඇත. මේ හැර උඳු, මුං, තල, අමු, අබ, දුරු, යව, තණ වැනි ධාන්‍ය වර්ග ද වගාකළ අතර, පුහුල්, මුරුංගා, මෑ, කැකිරි, වැනි එළවළු වර්ගත්, කෙසෙල්, දොඩම්, දෙහි, අඹ, කොස්, දෙල්, දිවුල් වැනි පළතුරු වර්ගත්, බතල වැනි අල වර්ගත් කපු සහ මිරිස් වැනි වගාවන් ද කළ බවට සාධක මධ්‍යතන ලංකාවේ සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් ලබාගත හැකිය. ගොඩමඩ දෙකෙහි ම වී ගොවිතැන කරනු ලැබූ බව දැකගත හැකිය. කුඹුරු වගාව සරුවීම සඳහා පොහොර යෙදීමේ

ක්‍රම භාවිත වූ බවට ඉඟියක් බුත්සරණෙහි දැක්වේ. සාමාන්‍ය වශයෙන් වී ගොවිතැන යල සහ මහ කන්න දෙකෙහි සිදුකළ අතර, ජල අවශ්‍යතා පිරිමසාගත හැකි අවධිවලදී මැද කන්නයක් වගා කළ බව පෙනේ. හේන් ගොවිතැන ද බහුලව සිදුකොට ඇත. හේන්වලින් අයකරන ලද බද්දක් අහෝසි කරන ලද බව නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපිවල සඳහන් වේ. ගොවිතැන කිරීමේ දී අන්‍යෝන්‍ය සහාය හා සුහදතාව පැවතිබව පෙනේ. (බස්නායක, 2015: 360).

**වෙළඳාම**

කෘෂිකර්මාන්තය හැරුණු විට වෙළඳාම අනෙක් ප්‍රධාන ආදායම් මාර්ගය විය. දේශීය මෙන්ම විදේශීය වෙළදාම් කටයුතු ද පැවතුණි. රජය කෙළින් ම පිටරටවල් සමඟ කළ වෙළඳාමෙන් ලැබුණු ලාබය ආදායමේ වැදගත් කොටසක් විය. චෝළයන්ට විරුද්ධව යුද්ධ කිරීමට වුවමනා ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ලක්දිව මා හැඟි බඩු රාමාඤ්ඤයට යැවූ විජයබාහු රජතුමා ඒ වෙනුවට විචිත්‍ර වස්ත්‍ර, කපුරු, සඳුන් ආදිය එරටින් නැව් පුරවා ගෙන්වා ගත්තේය. එහෙත් ආදායම වැඩි කරනු සඳහා රජයත් පිටරටවලුත් අතර ලොකු වෙළඳාමක් ඇති කළේ පරාක්‍රමබාහු රජතුමායි. මෙහිලා ඔහු අර්ථ ශාස්ත්‍රයේ උපදේශ අනුගමනය කළ බව නිසැකය. දක්ඛිණ දේශයේ රජව සිටියදී හෙතෙම අන්තරංග ධුර නමැති බෙත්මක් වෙන ම ඇති කළේය. විදේශ වෙළඳාම දියුණු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපදින පෙදෙස් මේ බෙත්මට භාරව තිබුණේය. මේවා නම් මුතු හටගන්නා වෙරළබඩ පෙදෙස්, මැණික් පතල් ඇති පෙදෙස්, පිටරටවලට විකිණිය හැකි විවිධ වන ද්‍රව්‍ය හා ඇතුන් ඇති මහා මලය දේශය යන මේවාය. මෙසේ එකතු කරගත් වටිනා වෙළඳ බඩු තොගය පිටරටවලදී විකුණනු සඳහා නැව්වලින් යවන ලදි. මේ වෙළඳාමෙන් ඔහු ලාබ ලැබූ බව නිසැක ය. මුළු ලක්දිව රජකම ඔහුට ලැබුණු පසුත් රජය සහ පිටරටවල් අතර වෙළඳාම නොකඩවා කරන ලදි. (පරණවිතාන (සංස්), 1972: 522).

පරාක්‍රමබාහු රජතුමා විසින් ජාත්‍යන්තර වෙළඳ කටයුතු සම්බන්ධයෙන් උනන්දුවකින් කටයුතු කළ බව බුරුමය හා සම්බන්ධ ඓතිහාසික ප්‍රවෘත්ති සාක්ෂි දරයි. (ගුණවර්ධන, 2005ඃ 2). ලංකාවත්, රාමාඤ්ඤ දේශයත් අතර දීර්ඝ කාලයක් තිස්සේ මිත්‍ර සම්බන්ධතා පැවති නමුත් රාමඤ්ඤ දේශයේ රජු විටෙක ලංකාවෙන් ගිය දූතයන්ට අතවර කරන ලද බවත්, බුරුමයේ දී ඇතුන් මිළට ගත් සිංහලයින්ට දුෂ්කරතාවන්ට මුහුණ පාන ලෙස හදිසියේ ඇතුන්ගේ මිළ ගණන් අධික කළ බවත්, ලංකාවෙන් ත්‍යාග පිණිස යවන ලද හැම නැවකට ම ඇතකු බැගින් ප්‍රදානය කිරීමේ වීරසම්මත සිරිත නවතා දැමූ බවත් චූලවංශය සඳහන් කරයි. බුරුම රජුට හසුන්පත් සමඟ ලංකාවෙන් යවන ලද දූතයින් බුරුමයට එවූවන් නොව කාම්බෝජයට යවන ලද දූතයින් බව දක්වමින් ඔවුන්ගේ වස්තු කොල්ල කා ඔවුන් සිරයට දමන ලද බව ද, ඉක්බිතිව මෙම සිරකරුවන්ගෙන් සමහරෙකු පතුළ සිදුරු වූ නැවකින් ආපසු පිටත් කර යවන ලද බව ද, එයින් පසු ලංකාවෙන් බුරුමයට දූතයින් නො පැමිණිය යුතු යැයි ප්‍රකාශ කළ බව ද සඳහන් කරන චූලවංශය බුරුම රජු ලංකාවෙන් යවන ලද වෙළඳ භාණ්ඩවලට ඇතුන් 14දෙනෙකු සහ මුදල් දෙන බවට පොරොන්දු වුව ද, කිසිවක් නො දී ඒවා කොල්ල කන ලදැයි ද, ලංකාවෙන් කාම්බෝජයට යවන ලද කුමරියක බලහත්කාරයෙන් නතර කරගන්නා ලදැයි ද වැඩිදුරටත් දක්වයි. (සිරිවීර, 2001ඃ 95)

මෙම විස්තරයට අනුව දිවයිනේ සමුද්‍රසන්න ප්‍රදේශයන්හි නැව් සාදවන ලද පරාක්‍රමබාහු රජු අවුරුද්දකට පමණ අවශ්‍ය ආහාරපාන ද සපයා විශාල යුද්ධ සේනාංකයක් රාමඤ්ඤ දේශයට යැව්වේය. නමුත් මෙම නැව්වලින් රාශියක් කිඳා බසින ලද බවත්, එක් නැවක් කාකද්වීපයට ළඟා වූ බවත්, නැව් පහක භටයින් රාමඤ්ඤ දේශයට ළඟා වී එහි කු රායේ දී සටන් කර අති විශාල ජයග්‍රහණයක් ලැබූ බවත්, එක් නැවක් පප්ඵාලම නම් වරායට ළඟා වී රාමාඤ්ඤ රාජ්‍යයේ විශාල පෙරළියක් කරන ලද බවත්, අවසානයේ දී රාමාඤ්ඤ රජු මරා දමන ලද බවත්, භීතියට පත් රාමාඤ්ඤ වැසියන් සිංහල රජුගේ ආධිපත්‍යය පිළිගෙන වාර්ෂිකව කප්පම් ගෙවීමට පොරොන්දු වී ලංකාවේ

භික්ෂූන්ට ආයාචනා කළ බවත්, එම භික්ෂූන්ගේ ඉල්ලීම නිසා පරාක්‍රමබාහු රජු අනුකම්පාවෙන් බුරුමය සමඟ යලි මිත්‍ර වූ බවත් මෙම විස්තරයේ ම සඳහන් වේ. (එම, 96)

මානසොල්ලාසය නම් ග්‍රන්ථයෙහි සිංහල දීපයෙන් ලැබුණු රෙදි පිළිවල නම් ඇතුළත් වේ. ඉන්දියාව, අරාබිය, චීනය වැනි රටවලින් පැමිණි වෙළෙන්දෝ වෙළඳ ශ්‍රේණි පිහිටුවාගෙන සිටි බව වාහල්කඩ, පදවිය, ආනඋලුන්දාවෙන් ලැබී තිබෙන සෙල්ලිපිවලින් අනාවරණය වේ. ඇතැම් ශ්‍රේණි විසින් වේලයික්කාර හමුදාවට හේවා කණ්ඩායමක් ද දුන් බව කියැවේ. නානා දේශී යනුවෙන් නොයෙක් රටවල්වලට අයත් වෙළඳ පිරිසක් ද සිටි බව පෙනේ. ලීලාවතී රැජිණගේ කාලයේ දී අනුරාධපුරයේ රේගුවක් කරවා එහි ආදායමින් දාන ශාලාවකට කුළුබඩු සපයා දුන් බව දැක්වේ. අරාබි ජාතික ඉද්රිසි නැමැත්තා ක්‍රි. ව. 1154 දී එනම් පළමුවෙනි පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී ලියන ලද විස්තරයකට අනුව චීනයේ සහ වෙනත් දුර බැහැර රටවල නැව් ඉරාක් සහ ෆර්ස් යන රටවල තැනූ මත්පැන් රැගෙන මෙහි පැමිණි බව කියවේ. ලංකාවෙන් අපනයනය කරන ලද ද්‍රව්‍ය වශයෙන් සඳහන් වන්නේ පට රෙදි, මැණික්, පළිඟු, දියමන්ති හා සුගන්ධ වර්ගයි. තවත් අරාබි ජාතිකයකු වූ 'කස්විනි' විසින් කුළුබඩු, මැණික්, සුවඳ ද්‍රව්‍ය, දැව, බෙහෙත් බඩු, රන්, රිදී හා මුතු මෙරට තුළ නිශ්පාදනය වූ දෙය වශයෙන් සඳහන් කොට ඇත. (බස්නායක, 2015ඃ 358).

දේශීය වෙළඳාම ගැල් මාර්ගයෙන් සිදු වූ බවට තොරතුරු දැකගත හැකිය. ගැල්වල බඩු පටවාගත් වෙළඳ කණ්ඩායම් රටේ හැමතැනම වෙළඳාමේ යෙදුණාහ. එබඳු කණ්ඩායම්වල නායකයා 'සාත්තුනා' නම් විය. රට තුළ වෙළඳාම කළ මේ වෙළෙන්ඳන් අධික ජනගහණයක් ඇති සුප්‍රකට ස්ථාන එක් කරන පාරවල ආගිය බව නිසැකය. එබඳු මාවත් මැනවින් පවත්වා ගැනීම රජයේ යුතුකමක් ලෙස සලකන්ට ඇත. වැදගත් පාරවල ගව්වෙන් ගව්වට ලිපි සහිත ගල් කණු සිටුවීමෙන් පෙනෙන්නේ මංමාවත් එපරිද්දෙන් තබා ගන්නා ලද බවයි. (පරණවිතාන (සංස්), 1972ඃ 523)

**කාසි භාවිතය**

කාසි නිකුත් කිරීම රජවරුන්ගේ ඒකාධිකාරයක් විය. පළමුවෙනි විජයබාහු රජුගේ කාසි අනුකරණය කොට චෝළ රජුගේ නම ද නාගරී අකුරෙන් යොදා බාල රනින් හෝ රිදියෙන් සාදා රන් ආලේප කොට නිකුත් කොට තිබෙන්නේ පරාක්‍රමබාහු රජතුමාය. ඔහුගේ කාසි වටිනා ලෝහ වර්ගයකින් සාදා ඇති අතර, ඉන්පසු නිකුත් වූ කාසි බාල ලෝහ වර්ගයකින් තනා රිදී ආලේප කොට තිබූ ඒවා බව පෙනේ. නිශ්ශංකමල්ල රජතුමා ද කාසි වර්ග කිහිපයක් නිකුත් කර තිබේ. සාහස්සමල්ල, ලීලාවතී, චෝඩගංග සහ ධර්මාශෝක දේව යන රාජ්‍ය පාලකවරුන්ගේ කාලවලදී තඹ කාසි නිකුත් කොට ඇත. (බස්නායක, 2015ඃ 358). සෑම කාසියකම ප්‍රතිමුඛයෙහි කාසිය නිකුත් කළ පාලකයාගේ නම වාඩි වී සිටින රජ රූපය සමඟින් දක්නට ලැබෙන අතර, අභිමුඛයෙහි නැගී සිටින රාජ රූපය දක්නට ලැබේ. මෙම රූප මඟින් ධනයට අධිපති කුවේර දෙවියා පිළිඹිබු වන බවට ද මතයක් වෙයි. කෙසේ වෙතත් මෙම යුගය තුළදී නිකුත් කළ සෑම කාසියකට ම මෙම ලක්ෂණ පොදුය. පාලකයන්ගේ නම් කාසිවල යෙදී අත්තේ ශ්‍රී විජයබාහු, ශ්‍රී පරාක්‍රමබාහු, ශ්‍රී කාලිංග ලංකේජ, ශ්‍රී චොඩගංගාදේව, ශ්‍රී රාජ ලීලාවතී, ශ්‍රීමත් සහාස්සමල්ල හා ශ්‍රී ධර්මාශෝකදේව යනුවෙනි. මෙකී කාසි පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි දක්නට ඇත. (සෙනෙවිරත්න, 2005ඃ 323).

මේ කාසි චූලවංශයේ සඳහන් කර තිබෙන්නේ 'කහාපණ' යනුවෙනි. නිශ්ශංකමල්ල රජුගේ ලිපිවල 'මඩරන්' කියාත්, පොත් පත්වල 'මාඩරන්' කියාත් සඳහන් වී තිබෙන්නේ මේවාම බව පෙනේ. (බස්නායක, 2015ඃ 359). මේ වනාහි චෝළ රටේ 'මාඩයි' නමැති කාසිය ම බව පෙනේ. ඉඩම් බද්ද ගෙවීමේ දී මේ රත්රන් කාසිය පාවිච්චි කරන ලදි. (පරණවිතාන (සංස්), 1972ඃ 524). කහවණු, මසු හා රන් සද්ධර්මරත්නාවලියෙහි ද, පූජාවලියෙහි ද මුදල් හදල් වශයෙන් සඳහන් වී තිබේ. බොහෝ විට මෙසේ සඳහන් වන්නේ ගණනින් හො සංඛ්‍යාවෙනි. 'සියක් වටනා ගසට දෙසියයක් දී...., දෙසියයක් වටනා.... සාරසියයක් දී.... ලක්ෂ

ලක්ෂ වටනා පලස් දෙකක්', 'ඔහු පිට දහසින් බැඳි පියල්ලක් තබා' යනාදි පාඨ මීට කදිම නිදර්ශන වශයෙන් දැක්විය හැක. (ආරියපාල, 2014: 123)

දකුණු සුං පෙළපතේ රජවරුන්ගේ කාසි වැඩි හරියක් ඇතුළු චීන කාසි රැසක් පොළොන්නරුවේ රජ මාලිගාවේ තිබී සොයා ගැනීම වනාහි ඒ රට සමඟ වෙළඳ සබඳකම් පැවති බවට සාක්ෂියකි. පොළොන්නරුව, පඬුවස්නුවර හා දැදිගම යන ස්ථානවලින් ලැබුණු චීන වළං කැබලි ද ඒ නිගමනයට තුඩු දෙයි. ඊජිප්තුවේ මමලුක් සුල්තාන්වරුන්ගේත්, වෙන අරාබි රජවරුන්ගේත් කාසි ලංකාවෙන් සොයාගෙන තිබේ. ඒ රටවල් සමඟ වෙළඳාම් පැවති බවට එයින් ඔප්පු වේ. දකුණු ඉන්දියානු කාසි ද කීප තැනකින් සොයාගෙන තිබේ. ද්‍රවිඩ දේශය හා දක්කනය සමඟ වෙළඳාම සැරට කෙරෙන්නට ඇත. කලිංගයේ නැගෙනහිර ගංග වංශයට අයත් (1078-1150) අනන්තවර්මන් චෝඩගංග රජුගේ පළමු වැනි, දෙවැනි, තෙවැනි, සතර වැනි, පස් වැනි, සත් වැනි, නව වැනි, දස වැනි, හා දහතුන් වැනි රාජ්‍ය වර්ෂවලට අයත් රත්රන් පනම් කාසි මහනුවර දිස්ත්‍රික්කයේ හාරගම තිබී සොයාගෙන තිබේ. ලංකාව හා ඒ රට අතර වෙළඳාම පැවති බව එයින් ඔප්පු වේ. (පරණවිතාන (සංස්), 1972: 525)

**අයබදු ක්‍රමය**

පෙර යුගවල පරිද්දෙන් මේ යුගයේ දී ද රාජකීය භාණ්ඩාගාරයේ ප්‍රධාන ආධාරය වූයේ ඉඩම් බද්දයි. එනම්; රජයට දීමට ගොවීන් බැඳී සිටි කොටසයි. වික්‍රමබාහු රජුගේ කාලයේ දී උක් දණ්ඩක් මිරිකා සාරය ගන්නාක් මෙන් අධික බදු අය කළබව චූලවංශය දක්වයි. (බස්නායක, 2015: 361). නිශ්ශංකමල්ල රජුගේ එක් ශිලා ලිපියක මහා පරාක්‍රමබාහු රජුට මේ ගැන කෙළින් ම චෝදනා කර තිබේ. ආදායම් දියුණු කරවනු සඳහා නිශ්පාදනය වැඩි කරවීමේ අදහසින්, එතෙක් වගා නොකර තිබුණු ඉඩම් වගා කරවීමෙන් පරාක්‍රමබාහු රජතුමා අනුගමනය කළේ විධිමත් ප්‍රතිපත්තියකි. මේ සඳහා වගුරු ඉඩම්වල වතුර බැස යන්නට

සැලැස්සූ රජ තෙමේ ජලානයන ව්‍යාපාර ද ආරම්භ කළේය. එහෙත් රට දියුණු කරවීම සඳහා පටන් ගන්නා ලද බරපතළ වැඩ පිළිවෙලත්, යුද්ධ ව්‍යාපාරත් හේතු කොට ගෙන අස්වැන්නෙන් හයෙන් පංගුවට වඩා වැඩි බද්දක් රට වැසියන්ගෙන් ගන්නට ඔහුට සිදුවන්නට ඇත. පෙර රජුන් නොමඳ අය ගෙන දුස්ථ කළ ලංකාවාසීන්ට තමා විසින් සහනය දෙන ලදැයි නිශ්ශංකමල්ල රජු කියන කියමන පරාක්‍රමබාහු රජුට එල්ල කරන ලද්දක් බව පෙනේ. (පරණවිතාන (සංස්), 1972: 521).

ගල්පොත ශිලා ලිපිය හා වඳුරුප්පේ ශිලා ලිපිය වැනි ලේඛනයන්හි අමුණක වපසරිය ඇති හොඳම කුඹුරකින් අය කරන ලද වැඩිම බදු ප්‍රමාණය එක් අමුණු තුන් පැලක් වූ ධාන්‍ය සහ මුදලින් මඩරන් සය අකක් වූ බවත්, මධ්‍යම ප්‍රමාණයේ සාරවත්කමක් ඇති අමුණක වපසරියකින් අයකළ යුතු වැඩිම බදු ප්‍රමාණය එක් අමුණු දෙපැලක් වූ ධාන්‍ය සහ මුදලින් මඩරන් සතර අකක් වූ බවත්, නිසරු අමුණක කුඹුරකින් එක් අමුණු එක් පැලක් සහ මුදලින් මඩරන් තුන් අකක් වූ බවත් දක්වා තිබේ. නගරයන්හි පිහිටි වෙළඳපොළවලිනුත් රජයට බද්දක් ලැබුණු බව සඳහන් වේ. එසේම ප්‍රදේශ සීමාන්තවල තිබූ කඩවත්වලදී 'සුත්වත්' යනුවෙන් තීරු බද්දක් අයකොට තිබෙන බව පෙනේ. වැව් හා වාරි මාර්ගවලින් ජලය ලබාගැනීම නිසා 'දකපති' යනුවෙන් මුල් යුගයේ දී හැඳින් වූ දිය බද්ද මෙය යුගයේ දී 'දියදඩ' යනුවෙන් නම් වී ඇති බව සෙල්ලිපි සාධකවලින් පෙනේ. වැව්වල මසුන් ඇල්ලීම වෙනුවෙන් ද බද්දක් ගෙවූ බවට අනුමාන කළ හැකිය. "මහවතැනින් ගන්නා පිසඹරු වත" නම් බද්දක් ගැන ද සඳහන් වේ. පරණවිතාන මහතා මෙය මසුන් මරන්නන් විසින් ගෙවිය යුතු වූ බද්දක් යැයි සිතිය හැකි බව පෙන්වා දී තිබේ. ගලපාත විහාර සෙල්ලිපියේ සඳහන් වන 'කොළවෙල් අය' යන්න වතු බද්දක් යැයි ඒ මහතා තවදුරටත් පෙන්වා දෙයි. 'අදනාවැරියන්' යනුවෙන් ගස්වල එලදාවෙන් කොටසක් වශයෙන් හෝ කරත්තවල බඳින ගොනුන් හෝ කිරි දෙනුන් සඳහා අයකරන ලද බද්දක් විය හැකි බව අනුමාන කරයි. අනුරාධපුර නගරයේ දොරටු අසල දී මෙරට බඩුවලින් අය කරගන්නා ලද බද්දක් ගැන ලීලාවතී රැජිණගේ

අනුරාධපුර පුවරු ලිපියේ සඳහන් වේ. රජුගේ වෙනත් ආදායම් මාර්ග ලෙස උසාවිවලින් ලැබෙන දඩ ද සඳහන් කළ හැකිය. ධන සම්පත් අයිති පුද්ගලයකු පාරම්පරික හිමිකරුවකු නොතබා මිය ගිය විට එම සම්පත් අයිතිය රජුට හිමි විය. ඊට 'මළාරා' හෙවත් 'මරාළ' යන පදයෙන් හඳුන්වා තිබේ. (බස්නායක, 2015: 361). මේ ගැන කොඩ්රින්ටන් මහතා මෙසේ කියයි.

'රජු විසින් ජීවිත භුක්තිය සඳහා මිනිස්සුන්ට සමහර ඉඩම් දෙන ලදි. මළ බදු ගන්නා ලද මේ ඉඩම්වලින් හා වෙනත් ඉඩම්වලින් ද සෑම අයිතිකරුවකුගේ ම මරණින් පසු මළ බදු අය කරගැනීම පැවත ආ සිරිතය. එක් අයිතිකරුවකුගේ මරණින් පසු ඊළඟ උරුමක්කාරයාට ඉඩම් නැවත පැවරූ සෑම විටක ම මේ බද්ද අය කෙරිණි. සාමාන්‍යයෙන් මළ අයගේ චංචල දේපළින් තුනෙන් පංගුවක් ද, මේ චංචල බූදලයට හිමිකම් කීමට පුතකු නො සිටියහොත් සම්පූර්ණ ධනය ද මරාළ බද්ද වශයෙන් ගැනීම සිංහල රටෙහි පැවති සිරිතය. මේ සිරිත ලංකාවට පමණක් සාධාරණ වූවක් නො වේ. මෙය ඉන්දියාවේ උසස් පුද්ගලයන් ගැන බලන කල මෙයටත් වඩා දරුණු අන්දමින් ක්‍රියාත්මක වූ බව පෙනී යයි. ඔවුන් අවෑමෙන් ඔවුන්ගේ චංචල දේපළ සියල්ල ම රාජසන්තක කරන ලදි. මෙවැනි බද්දක් අය කරගැනීමට හේතුව වූයේ සියලු ඉඩම්වල හිමිකම රජු සතු වී යැයි සැලකීමයි. මළ සිරුර ආදාහනය කිරීමට අවසර දීමට ප්‍රථම, සිංහල හා දෙමළ රටවල 'බිම් පුලුටු' නම් බද්දක් අය කරගත් බව පෙනේ. මෙහි මූලාරම්භය ගැන බලන කළ මෙය මලබාරයේ පවතින 'පාත්තම්' නම් බදු අළුත් කිරීම සඳහා අය කරන ලද මුදලට සමාන බව පෙනේ. එහෙත් ලංකාවේ මෙය ඉඩම් හිමි වීම පිළිබඳ බද්දක් බවට පෙරළිණ.' (ආරියපාල, 204: 117, 118).

## නිගමනය

යථෝක්ත කරුණු විමසා බලන විට නිගමනය කළ හැකි කාරණය වන්නේ බෞද්ධ හා හින්දු ආගම ප්‍රචලිතව තිබුණු මේ සමයේ ජනයා ආගමික වතාවත්වල යෙදුණු බවයි. ගිහි, පැවිදි

උගතුන්ගේ ශිල්ප ශාස්ත්‍ර හදාළහ. විශේෂයෙන් අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පන්සල විය. වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා ගමින් ගමට වෛද්‍යවරු සිටියහ. රෝහල් ද පැවතුණි. ආගමික හා ජාතික උත්සවාදිය ද ක්‍රියාත්මක විය. සමාජයේ බොහෝ දුරට සාමය හා සමගිය තිබුණි. ඉහළ පැලැන්තියේ සාමාජිකයන්ගෙන් පහළ පැලැන්තිය පීඩා විඳි බවක් ද දැක ගත හැකිය. අධ්‍යාපනය, විවාහය, රැකියාව සියල්ල සිදු වූයේ කුලය පදනම් කරගෙන ය. ආර්ථිකය අතින් පොහොසත් අය ඉහළ ම සැප සම්පත් බුක්ති විඳි අතර, දුගී මගී යාචකාදීහු දුක්ඛිත ජීවිත ගත කළහ. දුප්පතුන් බොහෝ විට පොහොසතුන්ට බැල මෙහෙවර කිරීම, කුලී වැඩ කිරීම හෝ සුළු ස්වයං රැකියා කිරීම වැනි වෘත්තීන්හි යෙදුන අතර, ඔවුන්ට වැටුප් වශයෙන් කෑම, බීම, භාණ්ඩ හෝ සමහර විට සුළු මුදලක් ලැබිණි. එමෙන් ම විජයබාහු රජතුමා මෙන් ම පරාක්‍රමබාහු රජතුමා ද කෘෂි කර්මාන්තයට මුල් තැන දෙමින් වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමෙන් මෙන් ම අලුතෙන් නිර්මාණය කිරීමෙන් කෘෂි වගාව පෝෂණය කළ අතර, එයින් තම රාජ්‍යයේ ආර්ථිකය වර්ධනය කරගත්තේ ය. එමෙන් ම විදේශ රාජ්‍යයන් හා වෙළඳාම් කිරීමට තරම් බලගතු ආර්ථියක් රට තුළ පැවති බවයි. ශ්‍රී ලංකා රාජ්‍යයේ නෞකා තාක්ෂණය දියුණු වී පැවති බවට ද මෙම සටහන් හොඳ සාක්ෂියකි. බුරුම ජයග්‍රහණය ශ්‍රී ලංකාවේ රජෙකු අග්නිදිග ආසියාවේ සටනකින් ලද එකම ජයග්‍රහණය වේ. ඒ අතින් පරාක්‍රමබාහු රජුගේ කාර්ය සංසිද්ධිය අතිශය වැදගත් ය. නමුත් අය බදු එකතු කිරීමේ දී ජනතාවට දැඩි පීඩනයක් එල්ල වූ බවද පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ආරියපාල, ඇම්. බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳව ආරච්චි, චන්ද්‍රදාස (2004). *ලංකා ඉතිහාස ප්‍රදීපය*, වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

කහඳව ආරච්චි, චන්ද්‍රදාස (1995). *ලංකා ඉතිහාසයේ විකාශනය*, කොළඹ: සමයවර්ධන පොත්හල.

ගුණවර්ධන, ප්‍රිශාන්ත (2005). *පෞරාණික ස්ථාන හා ස්මාරක - පොළොන්නරුව දිස්ත්‍රික්කය*, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බස්නායක, එච්. ටී. (2015). *ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය - 1*, වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

බාලසූරිය, ජයසිංහ (2007). *මහවැලිය හා ඓතිහාසික පොළොන්නරුව*, කතෘ ප්‍රකාශනයකි.

ලගමුව, ආරිය (2015). *මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව*, නුගේගොඩ: සරසවි ප්‍රකාශන.

ලියනගමගේ, අමරදාස (2002). *මධ්‍ය කාලීන ලංකා ඉතිහාසය*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වනරතන හිමි, කඹුරුපිටියේ (1962). *පොළොන්නරු නටබුන්*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති (2014). *රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි*, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

සෙනෙවිරත්න, අනුරාධ (2005). *පොළොන්නරුව-මධ්‍යකාලීන අගනගරය*, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

De Silva, K. M. (2005). *A History of Sri Lanka*, Colombo: Vijitha Yapa Publication.

## සංස්කරණ ග්‍රන්ථ

පරණවිතාන, සෙනරත් (සංස්) (1972). *ලංකා ඉතිහාසය*, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

Kurukulasuriya, Veranjan and Wijjayapala, W. H. (2004), *Architectural History*, Colombo: Department of Archaeology.

## සඟරා ග්‍රන්ථ

නිකොලස්, සී. ඩබ්. (1966). 'මහා පරාක්‍රමබාහු රජතුමාගේ වාරි කර්මාන්ත.' *පොළොන්නරු යුගය* (විශේෂ කලාපය), කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.